# 2557 - මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2013

**5 ශ්‍රේණිය** **(08) සමාජ විද්‍යාව** **පැ තුනයි**

* I කොටසේ ප්‍රශ්න සියල්ලටත්, II කොටසින් තෝරාගත් ප්‍රශ්න **හතරකටත්** පිළිතුරු ලියන්න.

## I කොටස

**01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. සමාජ වර්ග හඳුනාගැනීම සඳහා සමාජ විද්‍යාඥයින් අනුගමනය කරනු ලබන ක්‍රමවේද 4 නම් කරන්න.

ii. සමාජීය විද්‍යා / සමාජ ශාස්ත්‍ර දෙකක් නම් කරන්න.

iii. චර්යාමය විද්‍යා විෂයන් දෙකක් නම් කරන්න.

iv. ආගම් පිළිබඳ මත ඉදිරිපත් කළ ජර්මන් සමාජ විද්‍යාඥයා කවරෙක් ද?

v. පල්ලියේ ඒකාධිපති දර්ශනයට එරෙහි වූ තැනැත්තා නම් කරන්න.

vi. 'සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයේ රීතීන් ' ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.

vii. නිළබල ක්‍රමයක ඇති ලක්ෂණ හතරක් නම් කරන්න.

viii. මැක්ස් වේබර් ගේ සමාජ ක්‍රියා න්‍යායේ කොටස් හතර නම් කරන්න.

ix. ඊ.ආර්. ලීච් දක්වන පරිදි විවාහයෙන් සිදුවන කාර්යන් දෙකක් සඳහන් කරන්න

x. සමාජ ප්‍රශ්න බොහොමයක් ඇති වීමට හේතු වන ප්‍රබල සාධක දෙකක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 4x10 = 40)

The National e-Learning Portal for The General Education

## II කොටස

02. 1. සමාජ විද්‍යාවේ ඉතිහාසය සැකවින් දක්වන්න. (ලකුණු 04)
2. 'සමාජයේ පැවැත්ම සඳහා සමාජ විද්‍යාව වැදගත්වේ'. විමසන්න. (ලකුණු 05)
3. බුදු දහමේ ඇති සමාජ විද්‍යාත්මක පදනම විස්තර කරන්න. (ලකුණු 06)

03. 1. සමාජානුයෝජන ක්‍රියාවලියේ දී පිරිවෙනේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)
2. තත්ත්වය හා කාර්යභාරය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 05)
3. ස්වාමි සේවක සම්බන්ධය සමාජයේ යහ පැවැත්මට කෙසේ ඉවහල් වේ ද? විමසන්න. (ලකුණු 06)

04. 1. සමාජ සංස්ථාවක මූලික ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 04)
2. විවාහය යනු කුමක්දැයි යන්න සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර ඇති නිර්වචන මගින් පහදන්න. (ලකුණු 05)
3. සමූහයක් තුළ පවතින මූලික ලක්ෂණ විවරණය කරන්න. (ලකුණු 06)

05. 1. සමාජ සමූහයන්හි කාර්යයන් නම් කරන්න. (ලකුණු 04)
2. සමාජය යනු කුමක් දැයි නිර්වචනය කරන්න. (ලකුණු 05)
3. පුද්ගල එකතුව සමාජයක් නොවේ. විමසන්න. (ලකුණු 06)

06. 1. සමාජ පාලනය යන්න අර්ථ නිරූපණය කරන්න. (ලකුණු 04)
2. දසරාජ ධර්මය තුළින් යහපත් රාජ්‍ය පාලනයක් ගොඩ නගන්නේ කෙසේද? (ලකුණු 05)
3. සමාජ වෙනස්වීම්වලට බලපාන ප්‍රධාන සාදක විස්තර කරන්න. (ලකුණු 06)

07. 1. සමාජ ප්‍රශ්න හඳුනා ගන්නේ කෙසේ ද? (ලකුණු 04)
2. ශ්‍රී ලංකාවේ දැකිය හැකි ප්‍රධාන සමාජ ප්‍රශ්නයක් විස්තර කරන්න. (ලකුණු 05)
3. සමාජ ප්‍රශ්න වළක්වා ගැනීමට බුදු දහම තුළින් ලැබෙන පිටිවහල කෙබඳු ද? (ලකුණු 06)

08. 1. සමාජ වෙනස්වීම් බුදුදහම විග්‍රහ කරන්නේ කෙසේද? (ලකුණු 04)
2. ප්‍රජාව යනු කුමක් දැයි විස්තර කරන්න. (ලකුණු 05)
3. බෞද්ධ ශාන්ති කර්ම තුළ පවතින සමාජ විද්‍යාත්මක අගය විමසන්න. (ලකුණු 06)